# 2024-04-29 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

## 01. ඉන්දුනීසියා - ශ්‍රී ලංකා වරණීය වෙළෙඳ ගිවිසුම (ISLPTA)

ඉන්දුනීසියාව සමඟ වරණීය වෙළෙඳ ගිවිසුමකට එළඹීම සම්බන්ධයෙන් සාකච්ඡා ආරම්භ කිරීම සඳහා 2023-07-10 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ පිළිබඳව නිල සාකච්ඡා 2024-03-14 දින විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා සහ ඉන්දුනීසියාවේ වෙළෙඳ නියෝජ්‍ය අමාත්‍යතුමා අතර පවත්වා ඇති අතර, වෙළෙඳ සාකච්ඡා කමිටුවේ පළමු රැස්වීම මාර්ගගත ක්‍රමය ඔස්සේ 2024-04-03 සහ 04 යන දෙදින තුළ පවත්වනු ලැබ තිබේ. එම සාකච්ඡා කමිටුවේදී සාකච්ඡා ක්‍රමවේදය, අදාළ දත්ත හුවමාරු කර ගැනීමේ කාලරාමුව, විෂයපථය සහ ආවරණය යන ක්ෂේත්‍ර පිළිබඳව දෙපාර්ශ්වය අතර අදහස් හුවමාරු කර ගනු ලැබ තිබේ. එම කමිටුවේ 02 වන රැස්වීම 2024-06-19 සහ 20 යන දිනවලදී කොළඹදී පැවැත්වීමට දෙපාර්ශ්වය එකඟ වී ඇත. ඒ අනුව, යෝජිත වරණීය වෙළෙඳ ගිවිසුම සම්බන්ධයෙන් ඉහත සඳහන් පරිදි මේ දක්වා අත්කර ගනු ලැබ ඇති ප්‍රගතිය පිළිබඳව ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ කරුණු අමාත්‍ය මණ්ඩලය විසින් සැලකිල්ලට ගන්නා ලදී.

## 02. මිරිස්ස සමුද්‍රීය කලාපය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුගත නිල් ධජ (Blue Flag) වෙරළ කලාපයක් හා සමුද්‍රීය වනජීවී අභයභූමියක් බවට පත් කිරීම

මිරිස්ස සමුද්‍රීය කලාපය වනජීවී අභයභූමියක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද යෝජනාව 2023-05-22 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සාකච්ඡාවට ගනු ලැබ ඇත. එහිදී එම යෝජනාව පිළිබඳව අදාළ සියලුම පාර්ශ්වයන්ගේ සහභාගීත්වයෙන් වැඩිදුරටත් කරුණු අධ්‍යයනය කර අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍ය අනුකමිටුවක් පත් කරනු ලැබ තිබේ. ඒ අනුව, එම අනුකමිටුව විසින් මිරිස්ස සමුද්‍රීය කලාපය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුගත නිල් ධජ (Blue Flag) වෙරළ කලාපයක් හා සමුද්‍රීය වනජීවී අභයභූමියක් බවට පරිවර්තනය කරමින් දකුණු පළාත් සංචාරක ආර්ථිකය පස්ගුණයකින් වර්ධනය කිරීම ඉලක්ක කර ගනිමින් සිය නිර්දේශ ඉදිරිපත් කරනු ලැබ ඇත. එකී



163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன அவெனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.

දු தொ T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk

www.dgi.gov.lk
www.news.lk

නිර්දේශයන් අදාළ විෂයභාර අමාත්‍යාංශ සහ ආයතන මඟින් ක්‍රියාත්මක කිරීම පිණිස ගරු අග්‍රාමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

### 03. කන්කසන්තුරය වරාය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය

ඉන්දීය ණය අරමුදල් යටතේ කන්කසන්තුරය වරාය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස 2017-05-02 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇති අතර ව්‍යාපෘති කළමනාකරණ උපදේශක සේවා පිරිනැමීම සඳහා 2019-12-18 දින අනුමැතිය ලබා දී තිබේ. උපදේශක සේවා ආයතනය විසින් සකස් කරනු ලැබ ඇති ඇස්තමේන්තුගත පිරිවැය අදාළ ණය මුදලට වඩා වැඩි වීම හේතුවෙන් ව්‍යාපෘතියෙහි කටයුතු අපේක්ෂිත පරිදි ඉදිරියට ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. එබැවින්, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමවේදය යටතේ එම ව්‍යාපෘතිය නිම කිරීමේ හැකියාව පිළිබඳව ඉන්දීය රජය සමඟ තවදුරටත් සාකච්ඡා කරනු ලැබ තිබේ. ඒ අනුව එම ව්‍යාපෘතියෙහි වැදගත්කම සැලකිල්ලට ගෙන, එහි සමස්ත ඇස්තමේන්තුගත පිරිවැය මූල්‍ය ප්‍රදානයක් වශයෙන් ලබා දීමට ඉන්දීය රජය එකඟතාව පළ කර ඇත. එකී මූල්‍ය ප්‍රදානය භාර ගැනීමටත්, ඒ සඳහා වන අදාළ ගිවිසුම්වලට එළඹීමටත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

### 04. ශ්‍රී ලංකාව සහ කසක්ස්ථානය අතර ද්විපාර්ශ්වික ගුවන් සේවා ගිවිසුම

කසක්ස්ථානය සහ ශ්‍රී ලංකාව අතර ගුවන්සේවා කටයුතු දියුණු කිරීම සඳහා දෙරටේ ගගනගාමී අධිකාරීන් අතර ගුවන්සේවා ගිවිසුමක් අත්සන් තැබීම පිණිස 2015-05-13 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබුණද, එකී ගුවන්සේවා ගිවිසුම මේ දක්වා අත්සන් කිරීමට හැකි වී නොමැත. යෝජිත ගුවන්සේවා ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවේ කවර හෝ ස්ථානයක සිට කසක්ස්ථානයේ ඇස්ටානා සහ/හෝ අල්මැටි දක්වා නිශ්චිත ගමන් මාර්ග ඔස්සේ සතියකට ගමන්වාර 07ක් ගුවන් සේවා මෙහෙයවීමට අපේක්ෂා කරනු ලැබේ. ඒ අනුව, දෙපාර්ශ්වය විසින් එකඟතාවට පැමිණ ඇති ගුවන්සේවා ගිවිසුමට අත්සන් තැබීම පිණිස වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. **කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි පිටත් වීමේ/සංක්‍රමණ කලාපය තුළ රත්‍රන් සාප්පුවක් (Gold Shop) ක්‍රියාත්මක කිරීම**

කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි පිටත් වීමේ/සංක්‍රමණ කලාපය තුළ නව ව්‍යාපාරික අවස්ථාවක් වශයෙන් රත්‍රන් ව්‍යාපාරය හඳුන්වාදීමේ යෝග්‍යතාව සලකා බලා ඇති අතර, ඒ සම්බන්ධයෙන් වන යෝජනා සීමාසහිත ගුවන්තොටුපොළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම විසින් ඉදිරිපත් කර ඇත. දැනට බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ තුළ මෙම පහසුකම නොමැති බැවින්, එහි පිටත් වීමේ/සංක්‍රමණ කලාපයේ "රත්‍රන් සාප්පුවක්" පිහිටුවීමට සීමාසහිත ගුවන්තොටුපොළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම සැලසුම් කර තිබේ. ඒ අනුව, කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි පිටත් වීමේ/සංක්‍රමණ කලාපය තුළ රත්‍රන් සාප්පුවක් ක්‍රියාත්මක කිරීම පිණිස සුදුසු මෙහෙයුම්කරුවෙකු තෝරා ගැනීම සඳහා ජාත්‍යන්තර තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් ලංසු කැඳවීම පිණිස වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. **සීමාසහිත සීනෝර් පදනමට අයත්, කරෙයිනගර් බෝට්ටු අංගනය ප්‍රතිසංස්කරණය කිරීම**

නෝර්වීජියානු රාජ්‍ය නොවන සංවිධානයක් වන NGU හි ආධාර මත 1967 දී යාපනයේ කරෙයිනගර්හි ස්ථාපිත කර ඇති සීමාසහිත සීනෝර් පදනම 1990 දී රාජ්‍ය සමාගමක් බවට පත් කර ඇත. මෙම පදනම ෆයිබර්ග්ලාස් බෝට්ටු නිෂ්පාදන කාර්යෙහි නිරත වී ඇති අතර, 1990 සිට එම ප්‍රදේශයේ පැවති තත්ත්වය හේතුවෙන් කරෙයිනගර් බෝට්ටු අංගනයේ මෙහෙයුම් කටයුතු නවතා දමා තිබේ. 2016 වර්ෂයේදී මෙම බෝට්ටු අංගනය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රුපියල් මිලියන 350ක් වැය කර ඇතත් අරමුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අවශේෂ සිවිල් වැඩ සහ යාන්ත්‍රීකරණ ප්‍රසම්පාදනය අවසන් කර නොමැත. සීමාසහිත සීනෝර් පදනමට අයත් කරෙයිනගර් බෝට්ටු අංගනය ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු අවසන් කිරීමට සහ තවත් කාර්යයන් කිහිපයක් සඳහා ශ්‍රී ලංකා රුපියල් මිලියන 290ක උපරිමයකට යටත්ව මූල්‍ය ප්‍රදානයක් ලබා දීමට ඉන්දීය රජය එකඟ වී තිබේ. මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ එකඟතාව ලැබී ඇත. යෝජිත මූල්‍ය ප්‍රදානය ලබා ගැනීම පිණිස දෙපාර්ශ්වය අතර

අත්සන් තැබීමට නියමිත අවබෝධතා ගිවිසුම සඳහා නීතිපතිගේ නිෂ්කාශනය සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ එකඟතාව ලැබී තිබේ. ඒ අනුව, එකී මූල්‍ය ප්‍රදානය ලබා ගැනීම සඳහා වන අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීම පිණිස ධීවර අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **රාජ්‍යතාන්ත්‍රික, රාජකාරි හෝ සේවා විදේශ ගමන් බලපත්‍ර හිමි පුද්ගලයින් වීසා අවසරපත්‍ර ලබා ගැනීමෙන් නිදහස් කිරීම සඳහා රුවන්ඩාව සහ ශ්‍රී ලංකාව අතර අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීම**

ශ්‍රී ලංකාව සහ රුවන්ඩාව අතර ද්විපාර්ශ්වික සබඳතා වැඩිදියුණු කිරීමේ අරමුණින් රටවල් දෙකෙහි රාජ්‍යතාන්ත්‍රික, රාජකාරි හෝ සේවා විදේශ ගමන් බලපත්‍ර හිමි පුද්ගලයන් වීසා අවසරපත්‍ර ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම පිණිස අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීම සඳහා 2019-05-07 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇති නමුත්, එකී ගිවිසුමට මේ දක්වා අත්සන් තැබීමට හැකි වී නොමැත. දෙපාර්ශ්වය අතර එකඟ වී ඇති රාජ්‍යතාන්ත්‍රික, රාජකාරි හෝ සේවා විදේශ ගමන් බලපත්‍ර හිමි පුරවැසියන් දින 30ක් නොඉක්මවන කාලසීමාවක් සඳහා වීසා අවසරපත්‍ර ලබා ගැනීමෙන් නිදහස් කිරීම සඳහා වන එකී අවබෝධතා ගිවිසුම රුවන්ඩාව සහ ශ්‍රී ලංකාව අතර අත්සන් තැබීම පිණිස මහජන ආරක්ෂක අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. **වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ශ්‍රී ලංකා වන විද්‍යායතනයේ සම්පත් වන විද්‍යා අධ්‍යාපනය ප්‍රචලිත කිරීම සඳහා යොදා ගැනීම**

වන සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා පවත්වනු ලබන නිත්‍ය සේවාස්ථ පුහුණු පාඨමාලාවට අමතරව, ශ්‍රී ලංකා වන විද්‍යායතනය සතු පහසුකම් භාවිත කරමින් රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනවල නිලධාරීන් සඳහා ද පුහුණු වැඩසටහන් පැවැත්වීම මගින් ඔවුන් තුළ වනාන්තර කෙරෙහි සුබවාදී ආකල්ප සහ දැනුම හා කුසලතා වර්ධනය කළ හැකි බව හඳුනාගෙන තිබේ. එමෙන්ම, ශ්‍රී ලංකා වන විද්‍යායතනය සතු පහසුකම් වෙනත් ආයතනවලට හා මහජනතාවට ලබා දීම මගින් රජයට අතිරේක ආදායමක් ලබා ගැනීමට ද හැකියාව ලැබෙනු ඇත. ඒ අනුව, කෙටිකාලීන පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා නුවරඑළිය ශ්‍රී ලංකා වන විද්‍යායතනය සහ එහි ඉනාමළුව ක්ෂේත්‍ර පුහුණු මධ්‍යස්ථානය බාහිර පාර්ශ්වයන් වෙත ද ලබා දීම පිණිස වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**09. වගා පාදක මිරිදිය ධීවර කර්මාන්තය තිරසර ලෙස සංවර්ධනය කිරීම**

එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත ග්‍රාමීය ජනතාවගේ ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව සහ ජීවනෝපාය වැඩිදියුණු කිරීම සහතික කිරීම සඳහා වන වගා පාදක මිරිදිය ධීවර කර්මාන්තය තිරසර ලෙස සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 3ක ප්‍රදානයක් ලබා දීමට ජපාන රජය එකඟතාව පළ කර ඇත. යෝජිත ව්‍යාපෘතිය අනුරාධපුරය, මඩකලපුව, මුලතිව් සහ මොනරාගල දිස්ත්‍රික්කයන්හි ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර එමඟින් තෝරාගත් ජලාශවල මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීමට සහ මිරිදිය ධීවර කර්මාන්තයේ තිරසර බව සහතික කිරීමට අපේක්ෂා කරනු ලබයි. ඒ අනුව, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස ආනයනය කිරීමට සැලසුම් කරනු ලැබ ඇති භාණ්ඩ සහ උපකරණ සඳහා අදාළ බදු නිදහස් කර ගැනීම පිණිස ධීවර අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**10. අන්තර්ජාතික සංවර්ධනය සඳහා වන OPEC අරමුදලේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වන තාක්ෂණික අධ්‍යාපන සංවර්ධන වැඩසටහනෙහි ව්‍යාපෘති කාලසීමාව දීර්ඝ කිරීම**

තාක්ෂණික අධ්‍යාපන සංවර්ධන වැඩසටහන 2018 වර්ෂයේදී ආරම්භ කර 2022 වර්ෂය වන විට අවසන් වීමට නියමිතව තිබුණ ද රටේ ඇති වූ කොවිඩ් තත්ත්වය සහ ආර්ථික අවපාතය වැනි හේතූන් මත, ව්‍යාපෘතිය නියමිත කාලය තුළ අවසන් කිරීමට නොහැකි වී ඇත. මීට ප්‍රථම එම ව්‍යාපෘතියේ කාලසීමාව 2024-03-30 දින දක්වා දීර්ඝ කිරීම පිණිස අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබේ. ව්‍යාපෘතිය යටතේ එක් පළාතකට තාක්ෂණ විද්‍යාගාර 04 බැගින් පළාත් 09හි විද්‍යාගාර 36ක් ඉදිකිරීමට සහ දැනට පවත්නා ගොඩනැගිලි 15ක විද්‍යාගාර වැඩිදියුණු කිරීමට සැලසුම් කර ඇත. මේ වන විට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 65%කි. තාක්ෂණවේදය විෂය ධාරාව දැනටමත් ක්‍රියාත්මක වන පාසල් 135ක් සඳහා කුඩා තාක්ෂණ ඒකක නිර්මාණයට සහ පරිවර්තනය කිරීමට මෙන්ම අවශ්‍ය තාක්ෂණික භාණ්ඩ, උපකරණ ලබා දීම හා ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘතිය යටතේ ඉතිරි වේ යැයි අපේක්ෂිත විදේශ මුදල් යෙදවීමට ද සැලසුම් කර තිබේ. ඒ අනුව, එම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකි වන පරිදි ව්‍යාපෘති කාලසීමාව තවදුරටත් 2025-03-30 දින දක්වා දීර්ඝ කිරීම පිණිස අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **CHINA HARBOUR ENGINEERING COMPANY (LANKA) LIMITED ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතියික ව්‍යාපාරයක් ලෙස නම් කිරීම**

රැකියා අවස්ථා උත්පාදනය කිරීම, තිරසර සංවර්ධනය සහ නේවාසික ප්‍රජාවක් පදිංචි කිරීමෙහිලා වන නාගරික පහසුකම් පිළිබඳ මෙහෙයුම් සම්බන්ධ ව්‍යාපාර කටයුතුවල නිරත ව්‍යාපාරයක් වශයෙන් CHINA HARBOUR ENGINEERING COMPANY (LANKA) LIMITED ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතියික ව්‍යාපාරයක් ලෙස නම් කිරීම පිණිස හඳුනා ගනු ලැබ ඇත. ඒ අනුව, එම ව්‍යාපාරය වෙත කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ II වන උපලේඛනය යටතේ හඳුනා ගනු ලැබ ඇති පනත්වලින් යෝජිත නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීමට සහ ඒ සඳහා වන නියමය ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත් කිරීමට ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. **1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත සංශෝධනය කිරීම**

1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත සංශෝධනය කිරීම සඳහා 2024-01-01 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් භාෂාත්‍රයෙන් සකස් කරනු ලැබ ඇති ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් තාක්ෂණ අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

13. **සියලුම ක්ෂේත්‍රවල ශාරීරික දඬුවම් පැමිණවීම තහනම් කිරීම සඳහා දණ්ඩ නීති සංග්‍රහය සහ අපරාධ නඩු විධාන සංග්‍රහ පනත සංශෝධනය කිරීම**

ශ්‍රී ලංකාව ද පාර්ශ්වකරුවෙකු වන ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය මඟින් ළමයෙකු සතු සිවිල්, දේශපාලන, ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් අවධාරණය කරනු ලැබ ඇත. දෙමාපියන්ගේ, නීත්‍යානුකූල භාරකරුවන්ගේ හෝ වෙනත් තැනැත්තෙකුගේ රැකවරණයෙහි සිටින ළමයෙකු ලිංගික අපයෝජනය ද ඇතුළුව සියලුම ආකාරයේ ශාරීරික හෝ මානසික ප්‍රචණ්ඩත්වයට ගොදුරු වීම, තුවාල සිදු කිරීම හෝ අපයෝජනයට ලක් කිරීම, නොසලකා හැරීම හෝ

නොසැලකිලිමත්භාවය, අයුතු ලෙස සැලකීම හෝ සූරාකෑමට ලක් කිරීම ආදියෙන් ආරක්ෂා කිරීම සඳහා යෝග්‍ය සියලුම නීතිමය, පරිපාලනමය සහ අධ්‍යාපනික ක්‍රියාමාර්ග රාජ්‍ය පාර්ශ්වකරුවන් විසින් ගත යුතු බව ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියේ 19(1) ව්‍යවස්ථාව මඟින් පෙන්වා දී තිබේ. නිවසේදී, විකල්ප රැකවරණ පසුබිම තුළ, දණ්ඩන නියෝග ක්‍රියාත්මක කිරීමේ ආයතනවල සහ පාසල්වල ශාරීරික දඬුවම් ලබා දීමට අදාළව පවතින නීතිමය විධිවිධාන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ශාරීරික දඬුවම් ඇතුළු අපයෝජනයන්ට සහ ප්‍රචණ්ඩතාවයට ළමුන් විශාල සංඛ්‍යාවක් ගොදුරු වන තත්ත්වයක් පවතින බව ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ කමිටුව විසින් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් මෑතකදී සිදු කරන ලද නිරීක්ෂණ මඟින් පෙන්වා දී ඇත. එසේම, මෑතකදී ගුරුවරයෙකු විසින් පහර දීම හේතුවෙන් ශ්‍රවණාබාධයකට ලක් වූ සිසුවකු විසින් පවරන ලද මූලික අයිතිවාසිකම් පෙත්සමකට අදාළ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව මඟින් අදාළ ගුරුවරයා සහ රජය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බවට තීරණය කරනු ලැබ ඇත. එවැනි ශාරීරික දඬුවම් ලබා දීම ළමයෙකුට ශාරීරික සහ මානසික වශයෙන් දීර්ඝකාලීන බලපෑමක් සිදු කරනු ලබන බව විද්‍යාත්මකව ද තහවුරු වී තිබේ. එබැවින්, කුරිරු සහ/හෝ නින්දිත ශාරීරික සහ/හෝ ශාරීරික නොවන දඬුවම් කාණ්ඩය යටතට ගැනෙන ඕනෑම ක්‍රියාවක් ආවරණය වන පරිදි නීතිමය සංශෝධන කඩිනමින් හඳුන්වා දිය යුතුව ඇත. ඒ අනුව, සියලුම ක්ෂේත්‍රවල ශාරීරික දඬුවම් පැමිණවීම තහනම් කිරීම සඳහා වන විධිවිධාන ඇතුළත් කරමින් දණ්ඩ නීති සංග්‍රහය සහ අපරාධ නඩු විධාන සංග්‍රහ පනත සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම පිණිස ගරු ජනාධිපතිතුමා සහ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

************